සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்

Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය | පැය 02 යි |
| கண்டுபிடிப்பு சோதனை | 02 மணி நேரம் |
| Diagnostic Test | 02 Hours |
| සිංහල භාෂාව හා සාහිත්‍යය | 07 ශ්‍රේණිය |
| சிங்கள மொழி மற்றும் இலக்கியம் | தரம் 07 |
| Sinhala language and literature | Grade 07 |

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ඉරි ඇඳි පදයේ අර්ථයට වඩාත් සමීප පිළිතුර තෝරන්න.

1. කුඹුරේ දී හමු වූ සිරිසෝම දුටු කවුරුත් "<u>කරල පැහිලා</u>" යැයි පැවසූහ.

    1. කරල් පැහිලා ඇත  11. වාසියක් සිදුවී ඇත.

    111. පාඩුවක් සිදුවී ඇත.  1V. අයහපත් කාලයක් උදා විය.

2. "අනවබෝධයෙන් යමක් කිරීම" යන අදහසට වඩාත් සමීප ප්‍රස්තාව පිරුළ වන්නේ

    1. ගඟට ඉණි කැපුවා වාගේ  11. අබරා සිල් ගත්තා වගේ

    111. ලෙඩ කපුටෝ වැල කනවා වගෙයි  1V. කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ

3. සඤ්ඤක අක්ෂර පමණක් යෙදී ඇති පිළිතුර තෝරන්න.

    1. ඥ,ඳ,ග,ඹ  11. ඡ,ඬ,ඳ,ඥ

    111. ඳ,ග,ඡ,ඹ  1V. ඬ,ඳ,ඤ,ඹ

4. මහාප්‍රාණ අක්ෂරයක් ඇතුළත් නොවන වරණය තෝරන්න

    1. ඡන්දය  11. වර්ධනය

    111. සජ්ඣායනාව  1V. පිළිතුර

5. මුල්ම වතාවට සිරිපා වදින්නට යන තැනැත්තා හැඳින්වීමට යොදන තනි පදය

1. නඩේ ගුරා | 11. කෝඩුකාරයා
111. සැහැල්ලුව | 1V. කරුණාවන්තයා

6. පහත සඳහන් පද අතුරින් උපසර්ග පදයක් නොවන්නේ

1. අයමාර්ගය | 11. අයහපත්
111. නිවහල් | 1V. අනුගමනය

7. අක්ෂර වින්‍යාසය අනුව නිවැරදි වචනය තෝරන්න.

1. ප්‍රශ්ණ | 11. ප්‍රෂ්තාර
111. නිශ්පල | 1V. ශිෂ්ටාචාරය

8. "උත්තම" යන පදයට විරුද්ධාර්ථ දෙන පදය වන්නේ,

1. උසස්
11. පහත්
111. අධම
1V. ශ්‍රේෂ්ඨ

9. "ඔවුහු" යන නාම පදය අයත් වන්නේ

1. උත්තම පුරුෂ බහු වචනයට ය. | 11. මධ්‍යම පුරුෂ ඒක වචනයට ය.
111. ප්‍රථම පුරුෂ බහු වචනයට ය. | 1V. මධ්‍යම පුරුෂ බහු වචනයට ය.

10. උක්ත පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1. මිනිස්සු,කුරුල්ලන්,මම,ඔවුන් | 11. ළමයි,වෛද්‍යවරු,මිනිසෙක්,ගැහැනියක්
111. අප,ඕ තොමෝ,ගුරුවරියක්,මා | 1V. බල්ලා,නරියෙකු,කාන්තාවක්,ඔවුහු

11. අභිගුණ්ඨික ජනයා භාවිත කරන "රෝලු" යන පදයට සාමාන්‍ය ව්‍යවහාරයේ භාවිතා වන පදය

1. වංගෙඩිය
11. කුල්ල
111. කළය
1V. පිහිය

12. අපි ගිලනුන්ට කාරුණිකව සලකමු යන වාක්‍යයේ ඉරි ඇඳී පදයේ ඇති පිල්ලම් අනුපිළිවෙළින් යෙදී ඇති වර්ණය වන්නේ

1. කෙටි පාපිල්ල,කෙටි ඇලපිල්ල, පාපිල්ල
11. කෙටි පාපිල්ල,කෙටි පාපිල්ල,ඇද පිල්ල
111. ඇල පිල්ල,ඇද පිල්ල, ඇල පිල්ල
1V. ඇල පිල්ල, කෙටි පාපිල්ල,ඉස්පිල්ල

13. පහත සඳහන් වාක්‍යයේ හිස්තැනට සුදුසු ආඛ්‍යාත පදය තෝරන්න

ගුරුතුමිය උදෑසනින් පාසලට ........................................................

1. ආවේ ය.
11. එති
111. එන්නේ ය
1V. ආවා ය

14. සේවකයෝ මහන්සි වී වැඩ ..................................................

1. කරන ලදි
11. කළහ
111. කරයි
1V. කළේ ය

15. රූපකයක් යෙදී ඇති පිළිතුර වන්නේ ................................................

1. අම්මා සඳකි
11. මුහුණ රෝස මලක් වගේ
111. අම්මා සඳක් මෙනි
1V. ගත රන්තරුවක් සේය

16. ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන්ගේ නිර්මාණයක් නොවන්නේ

1. මී කිරි
11. වෙසක් මිහිර
111. ඇත්ගාලේ දරු පෙම
1V. වෙසක් පහන

17. ගස වතු සුදු - වී පිරිසිදු

පොහොය නැති දු - සිල් ගත් බදු

මෙම කවිය කාගේ නිර්මාණයක්ද ?

1. ආනන්ද රාජකරුණා 11. මුනිදාස කුමාරතුංග

111. අරිසෙන් අනුබුදු 1V. ඇස්.මහින්ද හිමි

18. පහත දැක්වෙන අ ආ තීරු දෙක ගැළපු විට වඩාත් නිවැරදි වරණය වන්නේ

| අ | ආ |
| --- | --- |
| A බලමින් | D පූර්ව ක්‍රියා |
| B නටති | E අවසාන ක්‍රියා |
| C බලා | F මිශ්‍ර ක්‍රියා |

1. AE,BD,CF 11. AD,BE,CF

111. AF,BE,CD 1V. AF,BD,CF

19. දී ඇති පද අතුරින් යුගල පදයක් නොවන පිළිතුර තෝරන්න.

1. දුක සැප 11. අඹමල්

111. ඉඩම්කඩම් 1V. වතුපිටි

20. ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය වන්නේ

1. ගස් සුළඟට සෙලවෙති. 11. ඔබ පත්තරය කියවයි.

111. සෙබළු රටවල් රකිති. 1V. නුඹ පොත බලහු

( ලකුණු 2 X 20 = 40 )

## 11 වන කොටස

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1). පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන එකසිය පනහකට නො අඩු රචනයක් ලියන්න.

- i. වැසි දවසක්
- ii. වැඩිහිටියන් රැක බලා ගනිමු
- iii. පරිසරය පණ මෙන් සුරකිමු
- iv. සරණංකර සඟරජ හිමි
- v. නිරෝගිමත් ජීවිතයකට යහපුරුදු හුරු වෙමු

2). පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත් වීමට නියමිත ඔබ විද්‍යාලයේ වාර්ෂික ක්‍රීඩා උත්සවය සඳහා සහභාගී වන ලෙස දක්වමින් දෙමාපියන් වෙත යැවෙන ආරාධනා පත්‍රය සකස් කරන්න.

නැතහොත්

පාසලේ චාරිකා සංගමයේ ලේකම් ඔබ යැයි සිතා මෙවර අධ්‍යාපන චාරිකාව සඳහා කොළඹ පිහිටි ජාතික කෞතුකාගාරය නැරඹීමට අවසර ඉල්ලමින් ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ වෙත යවන රාජකාරී ලිපියක් සකස් කරන්න. ( ලකුණු 15 )

3). පහත දැක්වෙන ප්‍රකාශ ඇසුරින් වගුව සම්පූර්ණ කරන්න.

| කියමන | පාඩමේ නම | කීවේ කවුද? | කීවේ කාටද? |
|---|---|---|---|
| 1. "මොන දිවිල්ලක්ද? කෑ නොගහ ඉන්නවා" | | | |
| 2. "ආ ..... මට ඒක කියලා දෙන්න බැරි වුණා." | | | |
| 3. "තොපි මරණ නළලේ තබා අවුද?" | | | |
| 4. "අන්න ! අන්න සර් එනවා අපිත් යං" | | | |
| 5. "මම කුමන අන්‍යායක් කෙළෙම්ද?" | | | |

( ලකුණු 10 )

4). පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.

i. පන්සිය පනස් ජාතක පොත ලියවුණු යුගය හා එහි ඇතුළත් ජාතක කතා ගණන කීයද?

( ලකුණු 02 )

ii. සිරිපා සමය ආරම්භ කරන පොහොය සහ අවසාන කෙරෙන පොහොය දෙක කුමක්ද?

( ලකුණු 02 )

iii. වැලිවිට සරණංකර හිමියන්ට සඟරජ පදවිය ලැබෙන බව දැනගත් පසු උන්වහන්සේ පන්සලේ උළුවස්සේ ලියා තැබූ ආදර්ශවත් වැකිය කුමක්ද? ( ලකුණු 02 )

IV. එඩ්මන්ඩ් රදගුරු පියතුමාගේ දෙමාපියන් නම් කරන්න. ( ලකුණු 02 )

V. බලංගොඩ සමනල වැව ප්‍රදේශයෙන් සොයාගෙන ඇති යකඩ උදුනේ විශේෂත්වය කුමක්ද?
( ලකුණු 02 )

5). සමන් පිච්ච මල් ඉහිරුණු

නිල් තණකොළ පිට්ටනියක්

.............................................................

.............................................................

I. ඉහත කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න. ( ලකුණු 02 )

II. කවියේ ඇති උපමාව හා උපමේය වෙන් කර ලියන්න ( ලකුණු 02 )

III. මෙහි එන අවසාන ක්‍රියා පද මොනවාද? ( ලකුණු 02 )

IV. කවියේ සඳහන් විශේෂණ පද මොනවාද? ( ලකුණු 02 )

V. මෙම කවියේ අදහස ඔබේ වචනයෙන් ලියන්න. ( ලකුණු 02 )

## පිළිතුරු 7 - ශ්‍රේණිය - සිංහල භාෂාව හා සාහිත්‍යය

1. ii
2. ii
3. iii
4. iv
5. ii
6. i
7. iv
8. iii
9. iii
10. ii
11. i
12. iv
13. iv
14. ii
15. i
16. iv
17. ii
18. iii
19. ii
20. iii

## දෙවන කොටස

| | | | ලකුණු | |
|---|---|---|---|---|
| 1. | රචනාව අන්තර්ගතය | - | 10 | |
| | ශිල්පීය දක්ෂතා | - | 05 | ( ලකුණු 15 ) |

2. අරමුණ,දිනය,වේලාව,ස්ථානය,ප්‍රධාන ආරාධිතයා ආරාධනා කරන්නේ කවුරුන්ද?,ආරාධනා කරන්නේ කවුරුන්ටද? ආරාධනා කරන්නේ කොහේ සිටද?, ආරාධනා කරන දිනය යන මූලික කරුණු හා නිර්මාණශීලී බව ගැන කරුණු සලකමින් ලකුණු ලබා දෙන්න.

( ලකුණු 15 )

3.

| කියමන | පාඩමේ නම | කීවේ කවුද?<br>කීවේ කාටද? |
|---|---|---|
| i. | ගොවි බිරියගේ නුවණ | ගොවි බිරිය විසින් ගොවියාට |
| ii. | ඔයි රයිරේ ඔයි රාමා | සිරි මල් විසින් අනුරාධ මල්ලීට |
| iii. | තිලමුට්ඨි ජාතකය | රජ්පුරුවන් විසින් දිසාපාමොක් අචාර්යීන්ට |
| iv. | නිවේදන | මුදිත විසින් අසිතට |
| v. | තිලමුට්ඨි ජාතකය | දිසාපාමොක් අචාර විසින් මෑණියන්ට |

( ලකුණ( 2 X 5 = 10)

4. i. කුරුණෑගල යුගය 547

ii. උදුවප් පසළොස්වක පොහොය

වෙසක් පුර පසලොස්වක පොහොය

iii. "උඩගු නොව මහණ ", "උඩගු නොව මහණ"

iv. මිහිදු කුල සුරිය එච්.දියොගෝ මහතා මිහිදු කුල සූරිය ඒ.ක්ලේරා මහත්මිය

v. එය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වාතය ස්වාභාවික සුළං මාර්ගයෙන් ලබා ගැනීම.

( ලකුණු 2 X 5 = 10)

5. වගෙයි අහස අන්න බලනු

කොච්චර ලස්සනද රෑට

i. ඉහත කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

ii. උපමාව සමන් පිච්ච මල් ඉහිරුණු නිල් තණකොළ පිට්ටනියක්
උපමේව තරු පායා ඇති අහසක්

iii. ඉහිරුණු / බලනු

iv. සමන් පිච්ච /පිච්ච මල් / නිල් තණකොළ

රෑ අහස සමන් පිච්ච මල් ඉහිරුණු තණකොළ පිට්ටනියක් වගේ ලස්සනයි.

( ලකුණු 2 X 5 = 10)